# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1641/36 – 2010 පෙබරවාරි 17 වැනි බදාදා – 2010.02.17

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ යොමු අංකය: IR/10/41/2008.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත් වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම.

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියැවෙන) පනත් වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරිය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2009 අප්‍රේල් මස 27 වැනි දින අංක 1599/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට්* පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2009 අප්‍රේල් මස 20 වැනි දින දරන නියෝගයෙන්,

ජී. එල්. එල්. පීරිස් මහතා "පිය නිවස", හිනටිගල, තල්පේ, ගාල්ල.

සහ

සමූපකාර තොග වෙළඳ සංස්ථාව, අංක 27, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.

අතර පවත්නා 2009 මාර්තු මස 27 වන දින දරන කාර්මික ආරාවුල පිළිබඳ කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳව වූ කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා පී. නවරත්න මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය, අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින්, කම්කරු සබඳතා සහ මිනිස්බල අමාත්‍ය වන අතාවුද සෙනෙවිරත්න වන මම, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2009 අප්‍රේල් මස 20 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙසද මෙයින් නියෝග කරමි.

අතාවුද සෙනෙවිරත්න,
කම්කරු සබඳතා හා මිනිස්බල අමාත්‍ය.

2010 පෙබරවාරි මස 10 වැනි දින,
කොළඹ දී ය.

03-139/1

මගේ යොමු අංකය: IR/10/41/2008.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

ජී. එල්. එල්. පීරිස් මහතා "පිය නිවස", හිනටිගල, තල්පේ, ගාල්ල.

සහ

අධ්‍යක්ෂ මණ්ඩලය, සමූපකාර තොග වෙළඳ සංස්ථාව, අංක 27, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු සබඳතා සහ මිනිස්බල අමාත්‍ය, අතාවුද සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්

තලවතුගොඩ, නුගේගොඩ පාරෙන් එහා එකමුතු මාවත, අංක 570/බී1 හි, පී. නවරත්න මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**අතාවුද සෙනෙවිරත්න,**
කම්කරු සබඳතා හා මිනිස්බල අමාත්‍ය.

2010 පෙබරවාරි මස 10 වැනි දින,
කොළඹ දී ය.

මගේ යොමු අංකය: IR/10/41/2008.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය වන අධිකාරිය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ජී. එල්. එල්. පීරිස් මහතා "පිය නිවස", හිනටිගල, තල්පේ, ගාල්ල.

සහ

අධ්‍යක්ෂ මණ්ඩලය, සමූපකාර තොග වෙළඳ සංස්ථාව, අංක 27, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.

**අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ,**

සමූපකාර තොග වෙළඳ සංස්ථාව යටතේ පාලනය වූ පොළොන්නරුව, කුසුම් පොකුණ වී මිලදී ගැනීමේ මධ්‍යස්ථානයෙහි පිළිවෙළින්, 2002.01.01 දින සිට 2002.10.31 දින දක්වා සහ 2002.10.31 දින සිට දක්වා 2002.10.31 දින 2002.12.31 දින දක්වා වූ කාලසීමාවන් තුළදී සිදු වූ ඇතැයි කියනු ලබන වී තොග අඩුමානයන් සම්බන්ධයෙන් එහි සේවය කළ ජී. එල්. එල්. පීරිස් මහතා එම සංස්ථාවේ සේවයෙන් පහකිරීම යුක්තිසහගතද යන්න හා යුක්තිසහත නොවේ නම්, ඔහුට කුමන සහනයක් හිමිවිය යුතුද යන්න පිළිබඳවද වේ.

**ඩබ්. ජේ. එල්. යූ. විජයවීර,**
කම්කරු කොමසාරිස්.

2010 ජනවාරි මස 18 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

03 - 139/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.